2023 ජූලි

# ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව

**විමසීම්, අදහස් සහ ප්‍රතිචාර සඳහා:**
දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
විද්‍යුත් තැපෑල : ddod@cbsl.lk
දුරකථන : 011 2477189

**ISBN-978-624-5917-15-0**
ප්‍රථම මුද්‍රණය : 2023 ජූලි

# පටුන


හැඳින්වීම ........................................ 4

**I කොටස : මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම........................................ 7**

මහ බැංකුවෙහි අරමුණු සහ මුදල් ප්‍රතිපත්තිය ........................................ 7

ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුව ........................................ 8

මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ........................................ 9

**II කොටස : මුදල්ප්‍රතිපත්තියක්‍රියාත්මකකිරීම........................................11**

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හැඳින්වීම ........................................11

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී ද්‍රවශීලතා කළමනාකරණය ........................................11

ද්‍රවශීලතා කළමනාකරණය තුළ මහ බැංකු ද්‍රවශීලතාව ........................................12

ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණ ........................................16

ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විවට වෙළඳපොළ කටයුතු ........................................16

නිත්‍ය පහසුකම ........................................20

ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ........................................20

අනෙකුත් ප්‍රතිපත්ති උපකරණ ........................................ 21

**III කොටස : මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලිය ........................................ 23**

# හැඳින්වීම

ආර්ථික සුබසාධනය වැඩිදියුණු කිරීම සහ එමඟින් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා රටක රජය සහ මුදල් අධිකාරිය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ සඳහා කටයුතු කිරීමේදී, රජය සහ මුදල් අධිකාරිය විශේෂිත සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මත රඳා පවතී. එවැනි සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවල අරමුණ වනුයේ උද්ධමන පීඩනයෙන් තොර, ස්ථායී සහ තිරසාර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සහතික කිරීම සහ එමඟින් සමාජ සුභසාධනය වැඩිදියුණු කිරීමයි. දළ දේශීය නිෂ්පාදිතය, සේවා නියුක්තිය සහ සාමාන්‍ය මිල මට්ටම යනාදී සාර්ව ආර්ථික විචල්‍යවල උච්චාවචන අවම කිරීම සඳහා සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මඟින් මෙම අරමුණු ඉටු කර ගනු ලබයි. මෙම අරමුණු ඉටුකර ගැනීමට යොදා ගනු ලබන ප්‍රතිපත්ති, මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය අයවැය ප්‍රතිපත්තිය ලෙස දෙයාකාර වේ. ඒ අනුව, මහජනතාවගේ සුභසාධනය උදෙසා සාර්ව ආර්ථික කළමනාකරණයේදී සහ සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමේදී මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යන ප්‍රතිපත්ති ද්විත්වයම ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන්, බදුකරණය සහ රාජ්‍ය වියදම සමග සම්බන්ධ වන අතර, එමඟින් ආර්ථික කටයුතුවලට බලපෑමක් ඇති කෙරේ. ඒ අනුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති උපයෝගී කර ගැනීම මඟින් ද සමස්ත ආර්ථික ස්ථායිතාව සහ වර්ධනය ළඟා කර ගත හැකිය. කෙසේ වුවද බදු නීති සම්පාදනය කිරීම, රාජ්‍ය වියදම් වෙනස් කිරීම ආදිය සඳහා සාමාන්‍යයෙන් සැලකිය යුතු කාලයක් ගත වේ. එමෙන්ම, ආර්ථික පාර්ශවකරුවන් විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වෙනස්කම්වලට සහ ඔවුන්ගේ හැසිරීම වෙනස් කිරීමට ප්‍රතිචාර දැක්වීමට සහ ඔවුන්ගේ හැසිරීම වෙනස් කිරීමට ද සැලකිය යුතු කාලයක් ගත වේ. එබැවින්, විශේෂයෙන්ම, මිල මට්ටම් ස්ථායී කිරීම සඳහා, එනම් ආර්ථික ස්ථායිතාව ඇති කිරීම සඳහා වඩාත් ඉක්මන් හා ඵලදායී ප්‍රතිපත්තිය ලෙස සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ මුදල් ප්‍රතිපත්තියයි.

ආර්ථිකයක මුදලේ පිරිවැය සහ සැපයුම පාලනය කිරීම සඳහා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග මුදල් ප්‍රතිපත්තියට අදාළ වේ. මිල ස්ථායිතාව, එනම් අඩු හා ස්ථායී උද්ධමනයක් පවත්වා ගැනීම සඳහා ආර්ථික උච්චාවචන ඇතිවීම, එනම් ව්‍යාපාර චක්‍රවල තීව්‍රතාව අවම කිරීමේ අරමුණු ඇතිව මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරයි. එනම්, මහ බැංකුව සිය මුදල් මෙහෙයුම් ක්‍රියාමාර්ග තුළින් මුදල් හා ණය සැපයුම සහ ආර්ථිකයේ පවත්නා පොලී අනුපාතික වෙනස් කිරීම සඳහා බලපෑම් සිදු කරයි. පොලී අනුපාතිකය සහ මුදල් සැපයුම මත සිදු කරනු ලබන ගැළපුම් ණයදෙනුවන් සහ ණයගනුවන්ගේ හැසිරීම කෙරෙහි සෘජුවම බලපාන බැවින්, ආර්ථිකයට තීරණාත්මක බලපෑමක් ඇති කෙරේ. එවැනි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් අඩු හා ස්ථායී මිල මට්ටමක් සහ එමඟින්, අඩු උද්ධමනයක් තහවුරු කරන අතර, සමස්තයක් ලෙස පොදු මිල මට්ටම මෙන්ම, සේවා නියුක්තිය, නිමැවුම සහ අවසාන වශයෙන් මහජන සුභසාධනය කෙරෙහි එකී ක්‍රියාමාර්ග බලපෑම් ඇති කරනු ලබයි. යහපත් සාර්ව ආර්ථික ප්‍රතිඵල ළඟා කරගැනීම සඳහා මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර මනා සම්බන්ධයක් පැවතීම අතිශය වැදගත් වේ.

මහ බැංකුව, රටක ප්‍රධානතම මූල්‍ය අධිකාරිය වන අතර, මුදල් සහ මූල්‍ය අංශය තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, ගෙවීම් පද්ධති පවත්වාගෙන යෑම සහ නියාමනය කිරීම, අවසාන ණය දෙන්නා වශයෙන් කටයුතු කිරීම සහ බැංකු අධීක්ෂණය කිරීම ඇතුළු කටයුතු ගණනාවක් මහ බැංකුවට අයත් වේ. සාමාන්‍යයෙන්, රටක මහ බැංකුව ස්වාධීන ආයතනයක් වශයෙන් පිහිටුවා ඇති අතර, මුදල්, බැංකු සහ මූල්‍ය අංශයෙහි කටයුතු පාලනය සඳහා පනවා ඇති විවිධ අණපනත් ක්‍රියාත්මක කිරීමේ වගකීම උසුළයි.


මිල ස්ථායිතා අරමුණ සපුරා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී, මහ බැංකුව ප්‍රතිපත්ති උපකරණ ගණනාවක් භාවිත කරන අතර වර්තමානයේ භාවිත කරන වඩාත් වැදගත් මුදල් ප්‍රතිපත්ති උපකරණ ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විවට වෙළඳපොළ කටයුතු සැලකිය හැකිය. ප්‍රතිපත්ති පොලී අනුපාතික මෙන්ම, අනෙකුත් ප්‍රතිපත්ති උපකරණවල සිදු කරනු ලබන ඕනෑම වෙනස්කමක් මුදල් සහ ප්‍රාග්ධන වෙළඳපොළවල පොලී අනුපාතික කෙරෙහි බලපෑමක් ඇති කරන අතර, එමඟින් මූල්‍ය ආයතන සමග ගනුදෙනු කරනු ලබන ගනුදෙනුකරුවන් හට අදාළ වන පොලී අනුපාතික කෙරෙහි ද බලපෑමක් ඇති කෙරේ. ඒ අනුව, මුදල් ප්‍රතිපත්තිමය තීරණ, ආර්ථිකයේ සෙසු පොලී අනුපාතික හරහා පාරිභෝගික වියදම් සහ ව්‍යාපාරික ආයෝජන මෙන්ම, සමස්ත ආර්ථිකයෙහි ඉල්ලුම කෙරෙහි බලපෑම් ඇති කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව (මහ බැංකුව) රටේ මුදල් අධිකාරිය වශයෙන් පුළුල් කාර්යභාරයක් ඉටු කිරීමට බැඳී සිටියි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය සැකසීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම සඳහා බැඳී සිටින මහ බැංකුව, මුදල් ප්‍රතිපත්ති උපකරණ ක්‍රියාවේ යෙදවීම සිදු කරයි. ආර්ථිකයෙහි මිල ස්ථායිතා අරමුණ ළඟා කර ගැනීමේදී උපයෝගී කර ගන්නා මහ බැංකුවෙහි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා වෙළඳපොළ සහභාගිවන්නන් සහ මහජනතාව සමග අඛණ්ඩව සන්නිවේදනය කිරීමට මහ බැංකුව ප්‍රයත්න දරයි. ඒ අනුව, මහ බැංකුව, එහි වර්තමාන සහ අනාගත ප්‍රතිපත්තිමය දිශානතිය, ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම මෙන්ම, අනාගත මුදල් ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳව ද තොරතුරු ඉදිරිපත් කරයි. එම තොරතුරු මුදල් ප්‍රතිපත්තිය වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කිරීම සහ මහ ජනතාවගේ අපේක්ෂා කළමනාකරණය කිරීම සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා මහ බැංකුවේ කාර්යභාරය සම්බන්ධයෙන් මහජනතාවගේ දැනුම්වත්භාවය සහ අවබෝධය ඉහළ නැංවීම මෙම පත්‍රිකාවෙහි අරමුණ වේ. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී භාවිත කරනු ලබන උපකරණ සහ ප්‍රතිපත්ති පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම තුළින් මූල්‍ය පද්ධතියෙහි පාර්ශ්වකරුවන්ට මෙන්ම මහජනතාවට මුදල් ප්‍රතිපත්ති තීරණ සහ ඒවායෙහි අපේක්ෂිත ප්‍රතිඵලවලට සමගාමීව සිය ක්‍රියාකාරකම් හැඩගස්වා ගැනීමට හැකිවේ.

මෙම පත්‍රිකාව කොටස් තුනකින් සමන්විත වේ. පළමු කොටස තුළ මුදල් ප්‍රතිපත්ති අරමුණු, රාමුව සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය යනාදී මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ පසුබිම් තොරතුරු දක්වා ඇත. දෙවන කොටස මඟින් ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් වෙළඳපොළ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සහ මුදල් ප්‍රතිපත්ති උපකරණ පිළිබඳ විස්තර ද ඇතුළත්ව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කොට ඇත. තුන්වන කොටස තුළ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය පිළිබඳව සාකච්ඡා කෙරේ.

**1 වන රූප සටහන : මහ බැංකු අරමුණ සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**



**2 වන රූප සටහන : ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම - සාරාංශය**





ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික සහ මිල ස්ථායිතාව (අඩු සහ ස්ථායී උද්ධමනය) පවත්වා ගැනීමේ අරමුණ සපුරා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි.





ශ්‍රී ලංකා මහ බැංකුව, උද්ධමනය (කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව මනිනු ලබන) මැදිකාලීන වශයෙන් සියයට 4-6 මට්ටමක පවත්වා ගැනීම සඳහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව අනුගමනය කරයි.



මහ බැංකුවෙහි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් කෙටිකාලීන පොලී අනුපාතික වෙනස් කිරීම හරහා සමස්ත ඉල්ලුම අඩු කිරීම හෝ වැඩි කිරීම තුළින් උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කෙරේ. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය ලෙස බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය උපයෝගී කර ගැනේ.




මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ සංඥා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යන ප්‍රතිපත්ති පොලී අනුපාතිකවලින් සමන්විත නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ අනෙකුත් ප්‍රතිපත්ති උපකරණ භාවිත කරයි.




විවට වෙළඳපොළ කටයුතු හරහා දේශීය මුදල් වෙළඳපොළ තුළ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම මඟින්, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව තුළ පවත්වාගෙන යෑමට මහ බැංකුව උත්සාහ කරයි.



මූල්‍ය ආයතනවල ණය අනුපාතික සහ තැන්පතු අනුපාතික ද ඇතුළත්ව විවිධ පාර්ශ්වවල ආර්ථික තීරණ සඳහා බලපානු ලබන අනෙකුත් කෙටිකාලීන සහ දිගුකාලීන පොලී අනුපාතික මත බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය බලපෑම් කරයි.



පරිභෝජන වියදම් සහ ව්‍යාපාරික ආයෝජන ඉහළ නැංවීම දිරිමත් කිරීම සහ ආර්ථික වර්ධනය සඳහා පොලී අනුපාතික අඩු කිරීම උපකාරී වේ. පොලී අනුපාතික ඉහළ නැංවීම, පරිභෝජන වියදම් සහ ව්‍යාපාරික ආයෝජන අඩු කිරීම සඳහා බලපාන අතර, එය ආර්ථික වර්ධනය මන්දගාමී වීමට මෙන්ම උද්ධමනය පහත හෙළීමට හේතු වේ.



ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සමාලෝචනය කිරීම සහ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ තීරණ ගැනීම සිදු කරන අතර, එම තීරණ සාමාන්‍ය ජනතාවට සන්නිවේදනය කිරීමට කටයුතු කරයි.

# I කොටස : මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම

## මහ බැංකුවෙහි අරමුණු සහ මුදල් ප්‍රතිපත්තිය

ආර්ථික සහ මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම යන ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරයි. මිල ස්ථායීතාව පවත්වා ගැනීම මඟින් ආර්ථිකයෙහි පොදු මිල මට්ටමෙහි සැලකිය යුතු උච්චාවචන නොමැති බව එනම්, අඩු සහ ස්ථාවර උද්ධමනයක් පවතින බව පෙන්නුම් කරන අතර, එමඟින් මුදලෙහි වටිනාකම ආරක්ෂා කිරීම සහතික කරයි. මිල ස්ථාවරව පවතින විට, එනම්, ආර්ථිකයෙහි සැලකිය යුතු මිල විචලනයන් නොපවතින විට, ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ට සිය පාරිභෝජන සහ ආයෝජන තීරණ වඩාත් විශ්වසනීය ලෙස සිදු කිරීම තුළින් සීමිත සම්පත් කාර්යක්ෂමව බෙදා වෙන්කර ගැනීමට අවස්ථාව සැලසෙයි. ආර්ථික කටයුතු, සේවා නියුක්තිය සහ සමාජ සුභසාධනය කෙරෙහි පොදුවේ ප්‍රතිලාභ ඇතිවන පරිදි ස්ථායී ආර්ථික සහ ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මිල ස්ථායීතාව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය කොන්දේසියක් බව මහ බැංකුවේ ප්‍රධාන අරමුණු හා කාර්යභාරය තුළින් පිළිබිඹු වේ.




ආර්ථික අවපාත, ආර්ථික අසමතුලිතතා, පරිභෝජන සහ වත්කම් මිල කෘත්‍රිම ලෙස ඉහළ යෑම වැනි අභ්‍යන්තර සහ බාහිර කම්පනවලට මුහුණ දීමට මූල්‍ය පද්ධතියට ඇති හැකියාව මූල්‍ය පද්ධති ස්ථායීතාව මඟින් නිරූපණය කෙරේ. අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් යටතේ පවා ඉතුරුම් රැස්කර ගැනීමට සහ ඒවා ඵලදායී ආයෝජනවලට වෙන් කිරීමට, අවදානම් කළමනාකරණයට මෙන්ම ගෙවීම් හා පියවීම් පද්ධතිය වෙත පහසුකම් සැලසීමට ස්ථායී මූල්‍ය පද්ධතියක් උපකාරී වේ. එබැවින්, මූල්‍ය පද්ධති ස්ථායීතාව තුළින් වෙළඳපොළ සහභාගිවන්නන්ගේ ආයෝජන, ආර්ථික වර්ධනය හා ජනතාවගේ සුභසාධනය සඳහා හිතකර ආර්ථික සහ මූල්‍ය පරිසරයක් සහතික කරනු ලැබේ. මිල ස්ථායීතාව තහවුරු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මූල්‍ය පද්ධතිය හරහා ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වන බැවින් මෙම අරමුණු දෙක එකිනෙකට සම්බන්ධ වේ.

ආර්ථිකයේ මිල ස්ථායිතාව ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි. මිල ස්ථායිතාව ඇති කිරීමේ අරමුණින් මුදලෙහි පිරිවැය සහ ආර්ථිකයෙහි පවතින මුදල් ප්‍රමාණය මත බලපෑම් ඇති කිරීමට මහ බැංකුව මැදිහත්ව ගනු ලබන ක්‍රියාමාර්ග මුදල් ප්‍රතිපත්තියට අයත් වේ. මුදලෙහි පිරිවැය (පොලී අනුපාතිකය) සහ මුදල් ප්‍රමාණය (ව්‍යවහාර මුදල් සහ තැන්පතු) හෝ ණය ප්‍රමාණය (බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන විසින් ලබාදී ඇති ණය) පාලනය කිරීම තුළින් ආර්ථික කටයුතු සඳහා බලපෑම් ඇති කිරීමට මහ බැංකුවට හැකියාව ඇත. ඒ අනුව, ආර්ථිකයේ පරිභෝජන හෝ ආයෝජන වියදම් සඳහා බලපෑම් කිරීමට මහ බැංකුවට හැකියාවක් ඇති අතර, ආර්ථික වර්ධනයට සහ උද්ධමනයට ද එමඟින් බලපෑම් ඇති කරනු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීමට සහ ක්‍රියාත්මක කිරීමට අදාළ නීතිමය ප්‍රතිපාදන, එනම් මුදල් නීති පනතෙහි විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව සතුවේ. ඒ අනුව, මුදල් නීති පනතේ සඳහන් ප්‍රධාන අරමුණක් වන ආර්ථික සහ මිල ස්ථායිතාව පවත්වා ගැනීමේ අපේක්ෂාවෙන් මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති තීරණ ක්‍රියාත්මක කරනු ලබයි. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා මහ බැංකුව කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වන මතුපිට උද්ධමනය මැදිකාලීන වශයෙන් සියයට 4-6 අතර පරාසය තුළ පවත්වා ගැනීමට කටයුතු කරයි. විවිධ කම්පන හේතු කොටගෙන මෙම ඉලක්කයට සාපේක්ෂව තාවකාලික වෙනස්වීම් ඇති විය හැකි වුවද, යෝග්‍ය මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හරහා මැදිකාලීනව මිල මට්ටම ස්ථායීව පවත්වාගෙන යෑමට මහ බැංකුව කටයුතු කරයි.


# ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුව

ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුව, කාලානුරූපීව බොහෝ වෙනස්කම්වලට භාජනය වී ඇත. 1950 දී මහ බැංකුව ස්ථාපිත කරන අවස්ථාවේ සිට 1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලද අවස්ථාව දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියලෙහි අගය, ජාත්‍යන්තර මුදල් ඒකකයක් අනුව තීරණය වීමට ඉඩ සැලසෙන පරිදි, එනම්, මූලික වශයෙන් විනිමය අනුපාතිකය මත පදනම් වූ මුදල් ප්‍රතිපත්ති රාමුවක් මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී. විදේශීය උද්ධමනය කෙරෙන් දේශීය උද්ධමනය කෙරෙහි බලපෑම් ඇති කරනු ලැබීම නිසා පසුකාලීනව මෙම ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය දේශීය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට බාධාවක් ලෙස හඳුනා ගන්නා ලදී.

1977 සිට විවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් පසුව, මහ බැංකුව විසින් උද්ධමනය පාලනය කිරීම සඳහා ක්‍රමිකව නාමික විචල්‍යයක් (Nominal Anchor) යොදා ගනු ලැබූ අතර, සෘජු පාලනයන්ගෙන් බැහැර වෙමින් වෙළඳපොළ මත පදනම් වූ මුදල් ප්‍රතිපත්ති උපකරණ උපයෝගී කර ගන්නා ලදී. එතෙක් වෙළඳපොළ පදනම් කරගත් මුදල් ප්‍රතිපත්ති උපකරණ හඳුන්වා දීම මඟින් සෘජු පොලී අනුපාතික, විනිමය අනුපාතික සහ ණය පාලන මඟින් බලපෑම් කරන ලද ඉතුරුම් ඒකරාශීකරණය සහ සම්පත් කාර්යක්ෂම ලෙස බෙදා වෙන් කිරීම ශක්තිමත් කිරීම බලාපොරොත්තු විය. නාමික මිල මට්ටම සහ එහි හැසිරීම හෝ අපේක්ෂිත ආකාරයෙන් මිල මට්ටම පවත්වාගෙන යෑම සඳහා මුදල් අධිකාරිය කටයුතු කරනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳව ආර්ථික පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා සහ හැසිරීම් පාලනය කිරීම සඳහා මහ බැංකුව විසින් කිසියම් විචල්‍යයක් භාවිත කිරීම, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී නාමික විචල්‍යයක් යොදා ගැනීම ලෙස හැඳින්වේ. සාමාන්‍යයෙන් ප්‍රමාණාත්මක නාමික විචල්‍ය සහ මිල පදනම් කරගත් නාමික විචල්‍ය ලෙස දෙයාකාරයකින් නාමික විචල්‍ය උපයෝගී කර ගැනේ. ප්‍රමාණාත්මක නාමික විචල්‍ය විසින් මුදල් ඉලක්කක කරනු ලබන අතර, මිල පදනම් කරගත් නාමික විචල්‍ය මඟින් පොලී අනුපාතික හෝ විනිමය අනුපාතික ඉලක්කක කරනු ලැබේ.

1980 ගණන්වල මුල් භාගය තුළදී, මහ බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස මුදල් ඉලක්කකරණය (Monetary Targeting) යොදාගනු ලැබූ අතර, ඒ යටතේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන නාමික විචල්‍යය ලෙස මුදල් සමස්ත උපයෝගී කර ගන්නා ලදී. විශේෂයෙන්, මෙහෙයුම් ඉලක්කය ලෙස මහ බැංකුවෙහි සෘජු පාලනය යටතේ පවතින සංචිත මුදල් ද (සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් සහ මහ බැංකුවෙහි ඇති වාණිජ තැන්පතුවලින් සමන්විත), අතරමැදි ඉලක්කය ලෙස පුළුල් මුදල් සැපයුම ද උද්ධමන අරමුණු සපුරා ගැනීම සඳහා භාවිත කරන ලදී.

**3 වන රූප සටහන : ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි විකාශනය**



මෙම මුදල් ඉලක්කකරණ රාමුව තුළදී මුදල් සැපයුමෙහි සිදු වන වෙනස්වීම් මිල ස්ථායීතාවට බලපෑම් කරනු ලබන ප්‍රධාන සාධකය ලෙස සලකන ලදී. එබැවින්, රටේ මුදල් සැපයුම පාලනය කිරීම සඳහා මුදල් මෙහෙයුම් කටයුතු පුළුල් ලෙස යොදා ගැනුණි. කෙසේ වෙතත්, මුදල් සැපයුම සහ උද්ධමනය අතර සම්බන්ධතාව දුර්වල වීම සහ අධික විචලනය හේතුවෙන් නාමික විචල්‍යයක් ලෙස මුදල් සමස්තවල කාර්යභාරය අවිනිශ්චිත වීම මගින් මහ බැංකුවේ සන්නිවේදන උපායමාර්ගය සංකීර්ණ වීමේ ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව නවීකරණය කිරීමේ අවශ්‍යතාවක් පැන නැගුණි.

ඒ අනුව, 2000 ගණන්වල ආරම්භයේ සිට මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති රාමුව සඳහා නවීකරණ කිහිපයක් හඳුන්වා දෙන ලදී. මුදල් සැපයුම සහ උද්ධමනය අතර දුර්වල සම්බන්ධතාවක් පෙන්නුම් කිරීම ප්‍රධාන වශයෙන්ම හේතු කොටගෙන, 2015 වසරේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ඉලක්කකරණය සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය (Flexible Inflation Targeting) යන රාමු දෙකෙහිම ලක්ෂණ සහිතව වැඩිදියුණු කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුවක් තුළ සිය මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීය.. අපේක්ෂා කළමනාකරණය, විනිවිදභාවය සහ මුදල් ප්‍රතිපත්තියෙහි විශ්වසනීයත්වය තවදුරටත් වර්ධනය කර ගැනීමට මෙම මුදල් ප්‍රතිපත්ති රාමුව උපකාරී විය. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මහ බැංකුව විසින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව මනිනු ලබන මතුපිට උද්ධමනය මැදිකාලීන වශයෙන් සියයට 4-6 ක ඉලක්කගත පරාසයක් තුළ පවත්වා ගනිමින්, තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා සහාය වීම උදෙසා මුදල් ප්‍රතිපත්ති උපකරණ මෙහෙයවීම සිදු කෙරේ.


මුදල් ප්‍රතිපත්ති අරමුණු ඵලදායීව ඉටුකර ගැනීමට සහාය වීම සඳහා මහ බැංකුව විසින් උපයෝගී කර ගනු ලබන විචල්‍යය, මෙහෙයුම් ඉලක්කය වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් ප්‍රතිපත්ති රාමුවේ වර්තමාන මෙහෙයුම් ඉලක්කය ලෙස අන්තර් බැංකු වෙළඳපොළ තුළ ප්‍රධාන දර්ශකයක් ලෙස සලකනු ලබන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (Average Weighted Call Money Rate) භාවිත කරනු ලැබේ.

## මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය

මුදල් ප්‍රතිපත්තියට අදාළ තීරණ ගැනීමේ වගකීම වර්තමානයේදී මහ බැංකුවේ මුදල් මණ්ඩලය සතු වේ. සාමාන්‍යයෙන්, මුදල් මණ්ඩලය සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වසරකට අට වතාවක් විවරණය කරයි. මහ බැංකුව මෙම විවරණයන් සිදු කරනු ලබන දින වසර ආරම්භයේදීම ප්‍රකාශයට පත් කරයි. මේ සෑම විවරණයකදීම, මහ බැංකුවේ අධිපති විසින් ප්‍රධානත්වය දරන මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති කමිටුව දේශීය හා ගෝලීය සාර්ව ආර්ථික සහ මූල්‍ය වෙළඳපොළ ප්‍රවණතා පිළිබඳව මෙන්ම, ආර්ථිකයෙහි ඉදිරි දැක්ම පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණ මුදල් මණ්ඩලය වෙත සපයයි. තවද, මුදල් ප්‍රතිපත්ති කමිටුව තාක්ෂණික විශ්ලේෂණ මෙන්ම, පුරෝකථන මත පදනම්ව, සිය නිර්දේශ මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

මුදල් මණ්ඩලය විසින් වර්තමාන හා අපේක්ෂිත ආර්ථික තත්ත්වයන්ට ගැළපෙන වඩාත් යෝග්‍ය මුදල් ප්‍රතිපත්ති තීරණ ගනු ලබයි. උදාහරණයක් ලෙස, මැදිකාලීන ආර්ථිකය අධි ක්‍රියාකාරීත්වයකට යොමු වන බව පුරෝකථන මඟින් පෙන්නුම් කෙරේ නම්, ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම මඟින් සංකෝචනාත්මක මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් (මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමක්) මුදල් මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන අතර, එමඟින් සමස්ත ඉල්ලුම ඉහළ යෑම තුළින් ඇති වන පීඩනය සහ ඉහළ උද්ධමනය තුළින් ඇති වන අවදානම අවම කිරීමට ක්‍රියා කෙරේ. සාමාන්‍යයෙන්, මහ බැංකුව ඉහළ උද්ධමනය හෝ ඉහළ උද්ධමන අපේක්ෂා පවතින අවස්ථාවලදී සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ඒ සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම, විවට වෙළඳපොළ කටයුතු හරහා රජයේ සුරැකුම්පත් අලෙවි කිරීම මගින් ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සහ/හෝ වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ඉහළ නැංවීම ආදිය සිදු කරයි. අනෙක් අතට, මැදිකාලීන පුරෝකථන තුළින් පෙන්නුම් කරනු ලබන ආකාරයට ආර්ථික වර්ධනය මන්දගාමී වෙමින් සහ අඩු උද්ධමන පීඩනයක් හෝ ආර්ථික අවපාතයක් හෝ පසුබෑමට ලක්වීමක් පෙන්නුම් කරයි නම්, ආර්ථිකය උත්තේජනය කිරීමේ අරමුණින් මුදල් මණ්ඩලය, ප්‍රසාරණාත්මක මුදල් ප්‍රතිපත්තියක් (මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමක්) අනුගමනය කරයි. ප්‍රසාරණාත්මක මුදල් ප්‍රතිපත්තිය මඟින් පාරිභෝගික වියදම් මෙන්ම, ආයෝජන දිරිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීම සහ විවට වෙළඳපොළ කටයුතු යටතේ රජයේ සුරැකුම්පත් මිලට ගැනීම හරහා ආර්ථිකයට ද්‍රවශීලතාව සැපයීම සහ/හෝ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව පහත හෙළීම හරහා අතිරේක ද්‍රවශීලතාවක් ලබාදීමට ක්‍රියා කෙරේ. මුදල් මණ්ඩලය විසින් ගනු ලබන එම මුදල් ප්‍රතිපත්ති තීරණ මහජනතාව වෙත දැනුම් දීමට මහ බැංකුව කටයුතු කරයි.

## 4 වන රූප සටහන : මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය (සම්බන්ධ වන පාර්ශ්වයන් හා කාර්යයන්)




* යෝජිත මහ බැංකු පනත යටතේ, මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයක් වෙත පැවරේ.

# II කොටස : මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

## මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හැඳින්වීම

මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ මුදල් ප්‍රතිපත්ති උපකරණ උපයෝගී කර ගැනීම මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ලෙස හැඳින්වේ. දේශීය මුදල් වෙළඳපොළට අදාළ ප්‍රතිපත්ති උපකරණ භාවිත කරමින්, වෙළඳපොළෙහි පවතින අරමුදල් ප්‍රමාණය (මුදල් සැපයුම එනම්, මහජනතාව සතු ව්‍යවහාර මුදල් හා මූල්‍ය ආයතනවල පවත්වාගෙන යනු ලබන තැන්පතුවලින් සමන්විත සමස්ත මුදල් ප්‍රමාණය) සහ අරමුදල් පිරිවැය (පොලී අනුපාතිකය) හැසිරවීම මඟින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවනු ලබයි. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ සිදු කෙරෙන මහ බැංකුවේ ක්‍රියාකාරකම් දේශීය මුදල් වෙළඳපොළ කෙරෙහි බලපායි.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත්විට මුදල් මණ්ඩලයෙහි තීරණවලට අනුව, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු විසින් සිදු කරනු ලබයි. ඒ අනුව, දේශීය මුදල් වෙළඳපොළ සම්බන්ධ ක්‍රියාමාර්ග 'දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව' මඟින් ද, දේශීය විදේශ විනිමය වෙළඳපොළ සම්බන්ධ ක්‍රියාමාර්ග 'ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව' මගින් ද ක්‍රියාවට නංවනු ලැබේ.


දේශීය මුදල් වෙළඳපොළට බලපෑම් සිදු කිරීම සඳහා මහ බැංකුව සතුව මුදල් ප්‍රතිපත්ති උපකරණ රාශියක් පවතී. ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී භාවිත කරනු ලබන උපකරණ අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතික, විවට වෙළඳපොළ කටයුතු සහ වාණිජ බැංකුවල තැන්පතු මත පනවන ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ප්‍රධානතම උපකරණ ලෙස භාවිත කෙරේ. මෙම උපකරණ උපයෝගී කරගනිමින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමෙහි අරමුණු වන්නේ මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අනුව කෙටිකාලීන පොලී අනුපාතික යෝග්‍ය මට්ටමෙහි පවත්වාගෙන යමින් මිල ස්ථායිතා අරමුණ ළඟා කර ගැනීමයි. මේ ආකාරයෙන් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම දේශීය මුදල් වෙළඳපොළ සහභාගිත්ව ආයතන හරහා සිදු කරනු ලබයි. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා මෙම සහභාගිත්ව ආයතන සම්බන්ධ වීම තුළින් එම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මුදල් වෙළඳපොළ වෙත සහ ඉන්පසු, ආර්ථිකයේ සමස්ත පොලී අනුපාතික ව්‍යුහය කෙරෙහි ද සම්ප්‍රේෂණය වීම සිදු වේ.

## මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී ද්‍රවශීලතා කළමනාකරණය

මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී, ද්‍රවශීලතා කළමනාකරණය (Liquidity Management) ඉතා වැදගත් වේ. මහ බැංකුවේ අවසාන අරමුණ වන මිල ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා කෙටිකාලීන පොලී අනුපාතික හැසිරවීමට අදාළ වාණිජ බැංකුවල සංචිත (ද්‍රවශීලතාව) කළමනාකරණය කිරීමට යොදා ගන්නා රාමුව, උපකරණ සහ විශේෂයෙන්ම ක්‍රමවේදය ද්‍රවශීලතා කළමනාකරණය යන්නට අදාළ වේ. ඒ අනුව, වෙළඳපොළ පොලී අනුපාතික සහ ණය මැවීම යනාදිය ද්‍රවශීලතාව සමග සමීප සබඳතාවක් දක්වන හෙයින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව වැදගත් විචල්‍යයක් ලෙස සැලකේ.

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී පළමු පියවර ලෙස ද්‍රවශීලතාව ඇස්තමේන්තු කිරීම සැලකිය හැකිය. මහ බැංකුව විසින්, වෙළඳපොළ සහභාගිත්ව ආයතන සමග දෛනිකව සිදු කළ යුතු මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් තීරණය කිරීම සඳහා එය අවශ්‍ය වේ. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපකරණ හා උපායමාර්ග, මූලික වශයෙන් ද්‍රවශීලතා මට්ටම මත පදනම් වන බැවින්, වෙළඳපොළ ද්‍රවශීලතාව නිසි පරිදි හඳුනා ගැනීම සහ සමීපව අධීක්ෂණය කිරීම ඉතා වැදගත් වේ. ඒ අනුව, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, යෝග්‍ය මට්ටමෙහි සහ යෝග්‍ය දිශානතියෙහි පවත්වාගෙන යෑම සඳහා වන මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නිරවද්‍ය ද්‍රවශීලතා ඇස්තමේන්තු වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

## ද්‍රවශීලතාව කළමනාකරණය තුළ මහ බැංකු ද්‍රවශීලතාව




සාමාන්‍යයෙන් වාණිජ බැංකු තම දෛනික පියවීම් කටයුතු සපුරා ගැනීම සඳහා මහ බැංකු ගිණුමෙහි මුදල් තැන්පතු පවත්වාගෙන යනු ලබයි. ඊට අමතරව, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සඳහා එනම්, මුළු තැන්පතු ප්‍රමාණයම ගනුදෙනුකරුවන් වෙත ණය වශයෙන් සැපයීම වළක්වමින්, එම තැන්පතු ප්‍රමාණයෙන් නිශ්චිත ප්‍රමාණයක් මහ බැංකු ගිණුමෙහි පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව (එනම් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව) සපුරාලීම සඳහා ද වාණිජ බැංකු මහ බැංකුව සමග මුදල් තැන්පතු පවත්වා ගනී. වාණිජ බැංකු විසින් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ද දෛනික ගෙවීම් සඳහා පවත්වාගෙන යනු ලබන ගිණුමෙහිම පවත්වාගෙන යනු ලබයි. මුදල් මැවීමේ ක්‍රියාවලියේදී ප්‍රධානතම තැන්පතු භාර ගැනීමේ ආයතන ලෙස ක්‍රියා කරන ශ්‍රී ලංකාවේ සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සඳහා මෙන්ම එදිනෙදා පියවීම් කටයුතු සඳහා ද (නිෂ්කාශන අවශ්‍යතා සඳහා) සංචිත ශේෂ පවත්වා ගෙන යනු ලබයි. වාණිජ බැංකු විසින් සංචිත අවශ්‍යතාව සපුරාලීම සඳහා එලෙස මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන තැන්පතු ශේෂ මහ බැංකු ද්‍රවශීලතා කළමනාකරණයෙහි ප්‍රධාන සංරචකයක් ලෙස සැලකේ.

සුරැකුම්පත් මිල මත විශාල බලපෑමක් ඇති නොවන පරිදි වෙළඳපොළ සහභාගිවන්නන් හට සුරැකුම්පත් මත ගනුදෙනු සිදු කිරීමට ඇති හැකියාව නිරූපණය කරනු ලබන වෙළඳපොළ ද්‍රවශීලතාව (Market Liquidity) යන අදහස 'මහ බැංකු ද්‍රවශීලතාව', (Central Bank Liquidity) යන සංකල්පයෙන් වෙනස් වේ. එමෙන්ම, ද්‍රවශීලතාව යන යෙදුම විවිධ අර්ථ සහ ඇඟවීම් සඳහා මෙන්ම එය යොදා ගනු ලබන අවස්ථාව අනුව තීරණය වේ.

මූල්‍ය ආයතන විසින් නිශ්චිත දිනකදී මහ බැංකුව සමග පවත්වාගෙන යනු ලබන සංචිත එනම්, සංචිත ගිණුමේ සමස්ත ශේෂය (ජංගම ගිණුමේ ශේෂය, පියවීම් ගිණුමේ ශේෂය මෙන්ම නිෂ්කාශන ශේෂය ලෙස ද හඳුන්වනු ලබන සංචිත), මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගනු ලබන මහ බැංකු ද්‍රවශීලතාව ලෙස සලකනු ලබයි.

ඒ අනුව, මූල්‍ය ආයතන විසින් සිය සංචිත ගිණුමෙහි පවත්වාගෙන යනු ලබන මෙම මුදල් ශේෂවල එකතුව මත මහ බැංකු ද්‍රවශීලතාව රඳා පවතී. උදාහරණයක් ලෙස, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සඳහා මෙන්ම, පියවීම් කටයුතු සඳහා සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් යම් දිනකදී මහ බැංකුවේ සංචිත ගිණුම්වල පවත්වා ගනු ලබන සමස්ත ශේෂය රුපියල් බිලියන 150 ක් වේ නම්, එම දිනයට අදාළ, ද්‍රවශීලතාව රුපියල් බිලියන 150 ක් ලෙස සැලකිය හැකිය.

අදාළ වාණිජ බැංකුවලට (සහභාගිත්ව ආයතන) මෙම අරමුදල් අන්තර් බැංකු වෙළඳපොළ තුළ ණයට දීමට හෝ ණයට ගැනීම සඳහා භාවිත කළ හැකිය. කෙසේ වෙතත්, සමස්තයක් ලෙස ගත් කල, මූල්‍ය පද්ධතිය තුළ මෙම අරමුදල් සඳහා වන එකම මූලාශ්‍රය මහ බැංකුවයි. ඒ අනුව, මහ බැංකු ශේෂ පත්‍රයෙහි නිරූපණය කෙරෙන පරිදි ද්‍රවශීලතාව වෙනස්වීමක් සිදු වන්නේ මෙම සහභාගිත්ව ආයතන විසින් මහ බැංකුව සමග ගනුදෙනු කරන අවස්ථාවකදී පමණි. මෙම කරුණු සලකා, මහ බැංකු ද්‍රවශීලතාව තීරණය කරන සාධක ප්‍රධාන අනු කාණ්ඩ දෙකකට, එනම් ස්වායත්ත සාධක සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ සාධක ලෙස බෙදා වෙන් කළ හැකිය.

මහ බැංකුවේ සෘජු බලපෑමක් නොමැති මූල්‍ය ආයතනවල සංචිත ගිණුමේ ශේෂයන්හි සිදු වන වෙනස්වීම් හැර, මහ බැංකු ශේෂ පත්‍රයෙහි සඳහන් වන අනෙකුත් අයිතම ද්‍රවශීලතාව සඳහා බලපාන ස්වායත්ත සාධක ලෙස හඳුන්වනු ලබයි. මෙහිදී ප්‍රධානතම ස්වායත්ත සාධක ලෙස මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් වෙනස්වීම, සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය සහ මහ බැංකුව රජය සමග පවත්වාගෙන යනු ලබන ගිණුම්වල ශේෂ හඳුන්වා දිය හැකිය. මෙම සාධකවල වෙනස් වීම, මූල්‍ය ආයතන විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන සංචිත ගිණුම්වල ශේෂ සඳහා සෘජුව හා ස්වාධීනව බලපානු ලබන අතර,

**5 වන රූප සටහන: වෙළඳපොළ ද්‍රවශීලතාව වෙනස්වීම සඳහා බලපාන සාධක**

ද්‍රවශීලතාව අවශෝෂණය කරනු ලබන සාධක

ද්‍රවශීලතාව ඉහළ නංවනු ලබන සාධක

## ස්වායත්ත සාධක

- දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුව විදේශ විනිමය විකිණීම
- රජයේ විදේශ විනිමය ණය ආපසු ගෙවීම සඳහා මහ බැංකුව රජය වෙත විදේශ විනිමය විකිණීම
- බලපත්‍රලාභී වාණිජ බැංකු මහ බැංකුවෙන් ව්‍යවහාර මුදල් ආපසු ලබා ගැනීම
- මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් පරිණත වීම/පරිණත දිනට පෙර කල් පිරීමට සැලැස්වීම
- සහභාගිත්ව ආයතන විසින් මහ බැංකුවෙන් ලබා ගත් ණය සහ අත්තිකාරම් ආපසු ගෙවීම

- දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මහ බැංකුව විදේශ විනිමය මිලට ගැනීම
- රජයේ විදේශ ණය ලැබීම්වලට අදාළ විදේශ විනිමය මහ බැංකුව විසින් මිලට ගැනීම
- බලපත්‍රලාභී වාණිජ බැංකු, මහ බැංකුවේ ව්‍යවහාර මුදල් තැන්පත් කිරීම
- මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙළඳපොළෙන් මිලට ගැනීම
- මහ බැංකුවේ ලාභ රජයට පැවරීම
- මහ බැංකුව විසින් රජයට තාවකාලික අත්තිකාරම් ලබාදීම
- මහ බැංකුවෙන් සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත ණය සහ අත්තිකාරම් ලබාදීම

## මුදල් මෙහෙයුම් සම්බන්ධ සාධක

- මහ බැංකුව රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළඳපොළෙහි විකිණීම (ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි)
- මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් ස්ථාවර පදනම මත විකිණීම
- මහ බැංකුව විසින් මහ බැංකු සුරැකුම්පත් විකිණීම
- මහ බැංකුව විසින් සහභාගිත්ව ආයතන වෙත නිත්‍ය තැන්පතු පහසුකම් සැපයීම

- මහ බැංකුව විසින් ද්විතීයික වෙළඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලට ගැනීම (ප්‍රතිවිකුණුම් වෙන්දේසි)
- මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් ස්ථාවර පදනම මත මිලට ගැනීම
- මහ බැංකු සුරැකුම්පත් පරිණත වීම
- මහ බැංකුව විසින් සහභාගිත්ව ආයතන වෙත නිත්‍ය ණය පහසුකම් සැපයීම

එය ද්‍රවශීලතාව සැපයීම හෝ අවශෝෂණය (වැඩි කිරීම හෝ අඩු කිරීම) සඳහා හේතුවේ. උදාහරණයක් ලෙස, මහ බැංකුව වෙළඳපොළෙන් විදේශ විනිමය මිලට ගැනීම සහ විදේශ ණය ලැබීම් හරහා රජයට ලැබුණු විදේශ විනිමය රජය විසින් මහ බැංකුවට විකිණීම වැනි විදේශ විනිමය ගනුදෙනු නිසා මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් වෙනස් වීම සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතනවල සංචිත ගිණුමේ ශේෂය ඉහළ යෑම සිදු වන අතර, එමගින් වෙළඳපොළ ද්‍රවශීලතාව ඉහළ යෑම සිදු වේ. එමෙන්ම, මහ බැංකුව රජය වෙත තාවකාලික අත්තිකාරම් ලබාදීම මගින් රජය වෙත සපයන ශුද්ධ ණය ප්‍රමාණය ඉහළ යන අතර, එම අත්තිකාරම් රජය වෙනුවෙන් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන මූල්‍ය ආයතනවල සංචිත ගිණුමට තැන්පත් කිරීමෙන් මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ඉහළ යෑම සිදු වේ. ඒ අනුව, මූල්‍ය ආයතන විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන සංචිත ගිණුමක් හර කිරීම හෝ බැර කිරීම මගින් මහ බැංකුවේ ශේෂ පත්‍රයට සිදු කරනු ලබන ඕනෑම ගනුදෙනුවක් හේතුවෙන් මහ බැංකු ද්‍රවශීලතාව වෙනස් වේ.

මහ බැංකුවක් විසින් දෛනික වශයෙන් සිදු කළ යුතු විවෘත වෙළඳපොළ කටයුතුවල ස්වභාවය හා ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව සහ ද්‍රවශීලතාවට බලපාන ස්වායත්ත සාධක වෙනස්වීම් අනුව පිළියෙල කරනු ලබන දෛනික ද්‍රවශීලතා ඇස්තමේන්තුව සැලකිල්ලට ගැනීමෙනි. ඒ අනුව, සංචිත ප්‍රමාණය (මහ බැංකු ද්‍රවශීලතාව) තීරණය කෙරෙන සාධකවල දෙවන අනු කාණ්ඩය සමන්විත වන්නේ විවෘත වෙළඳපොළ කටයුතු ප්‍රමුඛ මහ බැංකු මුදල් මෙහෙයුම් කටයුතුවලිනි.

විවෘත වෙළඳපොළ කටයුතු හරහා ද්‍රවශීලතාව මත ඇතිවන බලපෑම පහත දැක්වෙන උදාහරණය මගින් පැහැදිලි කළ හැකිය. මහ බැංකුව විසින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකු වෙතින් ද්විතීයික වෙළඳපොළ හරහා රජයේ සුරැකුම්පත් මිලදී ගනී යයි උපකල්පනය කරමු. එහිදී මහ බැංකුව විසින් එම වාණිජ බැංකුවල සංචිත ගිණුමට අදාළ ගෙවීම් බැර කළ යුතු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එම ගිණුම්වල ශේෂ ඉහළ යෑම මගින් ද්‍රවශීලතාව ද ඉහළ යයි. එමෙන්ම මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට රජයේ සුරැකුම්පත් විකිණීමේදී එම බැංකුවල සංචිත ගිණුමේ ශේෂය හා ද්‍රවශීලතාව මත ඇති වන බලපෑම ඊට ප්‍රතිවිරුද්ධ වේ. ඒ අනුව, සාධක රැසක් සලකා බැලීම මගින් මහ බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන වාණිජ බැංකුවල සංචිත ගිණුම්වල සමස්ත ශේෂයෙහි ඇස්තමේන්තුවක් ලබා ගත හැකිය (5 වැනි රූප සටහන බලන්න).

මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත පනවා ඇති ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව අනුව, වාණිජ බැංකු විසින් එම අගයෙහි සාමාන්‍යය, නියම කරන ලද කාලසීමාවක් තුළ පවත්වාගත යුතු වුවත්, වාණිජ බැංකුවල සංචිත ගිණුමේ ශේෂය, දෛනිකව සංචිත අවශ්‍යතාවට වඩා අඩු හෝ වැඩි අගයක් විය හැකිය. උදාහරණයක් ලෙස, වාණිජ බැංකුවල පවතින ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය අනුව දිනකදී පවත්වාගත යුතු සමස්ත සංචිත අවශ්‍යතාව රුපියල් බිලියන 150 ක් යැයි සිතමු. කිසියම් දිනක් අවසානයේදී එකී වාණිජ බැංකු විසින් පවත්වා ගනු ලැබූ සමස්ත සංචිත ප්‍රමාණය රුපියල් බිලියන 135 කට අඩු වුවහොත්, සංචිත පවත්වාගෙන යා යුතු කාලසීමාව ලෙස සැලකෙන දින 15 ක අදාළ සංචිත කාලපරිච්ඡේදය අවසානය වන විට සමුච්චිත සංචිත අගයෙහි සාමාන්‍යය අවම වශයෙන් රුපියල් බිලියන 150 කට සමාන වන ලෙස පවත්වා ගෙන යා යුතුය. ඒ අනුව, අදාළ සංචිත කාලපරිච්ඡේදය අවසානය වනවිට, එක් එක් වාණිජ බැංකුවෙහි තැන්පතු ප්‍රමාණය මත තීරණය වන, සංචිත කාලපරිච්ඡේදයට අදාළ සංචිත ප්‍රමාණය වාණිජ බැංකු විසින් සපුරාලිය යුතුය. එනම්, එම කාලපරිච්ඡේදය තුළ වාණිජ බැංකුවේ ජංගම ගිණුමේ ශේෂයෙහි සාමාන්‍යය, අවම වශයෙන් එම කාලසීමාවෙහි අවම සංචිත අවශ්‍යතාවට සමාන විය යුතුය.

කෙසේ වෙතත්, සාමාන්‍යයෙන් වාණිජ බැංකු එදිනෙදා ගනුදෙනුවල අවිනිශ්චිතතා සහ අනපේක්ෂිත හා සැලසුම් නොකළ ගනුදෙනු හේතුවෙන් සිදු විය හැකි සංචිත හිඟයන් සැලකිල්ලට ගෙන අතිරික්ත සංචිත පවත්වා ගැනීමට කටයුතු කරයි. ඒ අනුව, වාණිජ බැංකුවල සංචිත ගිණුම් ශේෂය හා ඔවුන්ගේ සංචිත අවශ්‍යතාව අතර වෙනස මගින් කිසියම් දිනකට අදාළව හිඟ හෝ අතිරික්ත ද්‍රවශීලතාව තීරණය වේ. සංචිත ගිණුම් ශේෂය, බැංකුවල පවතින ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවට වඩා ඉහළ අගයක් ගනී නම්, එවිට බැංකු පද්ධතියෙහි ද්‍රවශීලතා අතිරික්තයක් පවතී යැයි සැලකිය හැකිය. උදාහරණයක් ලෙස, යම් දිනකට අදාළ අවශ්‍ය සංචිත ප්‍රමාණය රුපියල් බිලියන 150 ක් හා වාණිජ බැංකුවල සංචිත ගිණුම්වල සත්‍ය වශයෙන් පවතින ශේෂය රුපියල් බිලියන 165 ක් යයි ද සිතමු. එලෙස සංචිත අවශ්‍යතාව වන රුපියල් බිලියන 150 ක ප්‍රමාණයට අතිරික්ත වශයෙන් පවතින රුපියල් බිලියන 15 ක ප්‍රමාණය අතිරික්ත ද්‍රවශීලතාව ලෙස සැලකේ. අනෙක් අතට, යම් දිනකදී සංචිත ගිණුම් ශේෂය, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවට වඩා අඩු අගයක් ගනී නම්, එවිට බැංකු පද්ධතියෙහි ද්‍රවශීලතා හිඟයක් පවතී යැයි සැලකේ.

සංචිත ගිණුමේ පවත්වාගෙන යන සංචිත අතිරික්තයන්ට අදාළව කිසිදු ගෙවීමක් වාණිජ බැංකුවලට හිමි නොවන බැවින් අන්තර්-බැංකු මුදල් වෙළඳපොළ තුළ ණය සැපයීම, විවෘත වෙළඳපොළ වෙන්දේසි හරහා විවිධ කාලසීමාවන් සඳහා මහ බැංකුවේ අතිරික්ත මුදල් තැන්පත් කිරීම හෝ නිත්‍ය තැන්පතු පහසුකම යටතේ එක් දිනක් සඳහා මුදල් තැන්පත් කිරීම ආදී ක්‍රියාමාර්ග මගින් වාණිජ බැංකු තම අතිරික්ත ද්‍රවශීලතාව/සංචිත කළමනාකරණය කිරීම සිදු කරයි. අනෙක් අතට, වාණිජ බැංකුවක ද්‍රවශීලතා හිඟයක් පවතින විට, එම හිඟය මූල්‍යනය කිරීමට අන්තර් බැංකු ණය ලබාගැනීම සිදු කරයි. ඒ අනුව,

වාණිජ බැංකුවලට තම ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීමට අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ යොදා ගත හැකිය. අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපොළ යනු වාණිජ බැංකුවලට තම ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඔවුනොවුන් අතර ඇපකරයක් රහිතව එක් දින පදනමෙන් හෝ කෙටිකාලීන වශයෙන් ණය ලබාදීම සහ ණය ගැනීම සිදු කරන වෙළඳපොළකි. ඒක්ෂණ ණය වෙළඳපොළ ගනුදෙනු ස්වභාවයෙන්ම ඉතා කෙටිකාලීන වන අතර, එමගින් ද්‍රවශීලතාව සඳහා වන ඉල්ලුම සහ සැපයුම පෙන්නුම් කෙරේ. කෙසේ වෙතත්, කිසියම් බැංකුවකට අන්තර් බැංකු වෙළඳපොළෙන් සම්පූර්ණ වශයෙන් තම  ද්‍රවශීලතා අවශ්‍යතාව සපුරා ගැනීමට නොහැකි වූ විට, මහ බැංකුවේ විවට වෙළඳපොළ වෙන්දේසි හෝ නිත්‍ය ණය පහසුකම හරහා එම අවශ්‍යතා සපුරා ගැනීමට සිදු වේ.

අතිරික්ත හෝ හිඟ ද්‍රවශීලතා මට්ටම් කළමනාකරණය කිරීම සඳහා මහ බැංකුවකට සඵලදායී මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් රාමුවක් පැවතීම අත්‍යවශ්‍ය වේ. එයට හේතුව නම් ද්‍රවශීලතාවෙහි සිදු වන වෙනස්කම් වෙළඳපොළ පොලී අනුපාතික හා ආර්ථිකයට ඇති කරන බලපෑමයි. නිදසුනක් ලෙස, වාණිජ බැංකු සතුව අතිරික්ත ද්‍රවශීලතාවක් පවතින විට, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අපේක්ෂිත මට්ටමට වඩා පහළ යෑමට බලපෑම් ඇති වේ. ඒ නිසා, අතිරික්ත ද්‍රවශීලතාවක් පවතින අවස්ථාවලදී කෙටිකාලීන පොලී අනුපාතික අනවශ්‍ය ලෙස පහළ යෑම වැළැක්වීම සඳහා මහ බැංකුව විසින් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කිරීමට මුදල් මෙහෙයුම් කටයුතු සිදු කරයි. එමෙන්ම, ද්‍රවශීලතා හිඟයක් පවතින විට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ යෑමට බලපෑම් ඇති වේ. එහෙයින්, ද්‍රවශීලතා හිඟයක් පවතින අවස්ථාවකදී, වෙළඳපොළ අවශ්‍යතාව පරිදි මුදල් මෙහෙයුම් කටයුතු සිදු කිරීම හරහා ද්‍රවශීලතාව සැපයීමට මහ බැංකුව කටයුතු කරයි. එමගින් පොලී අනුපාතික මත ඇතිවන අනවශ්‍ය පීඩනය අවම කරනු ලබයි. එමනිසා, මහ බැංකුවට පොලී අනුපාතික නිසි මට්ටමක පවත්වා ගැනීම සඳහා, විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තියේ මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අවශ්‍ය පරිදි මෙහෙයවීම සඳහා ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම හා සැපයීම සිදු කිරීම මුදල් වෙළඳපොළ තුළ ඉතා වැදගත් මෙහෙයුම් කාර්යයක් වන අතර, එමගින් ආර්ථිකයෙහි මුදල් සහ ණය සැපයීම හා පිරිවැය කෙරෙහි බලපෑම් ඇති කෙරේ.

ද්‍රවශීලතාව සැපයීමේ කාර්යය මහ බැංකුවේ වගකීමට අදාළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ වේ. ද්‍රවශීලතාව සැපයීම යනු ගෙවීම් හා පියවීම් පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වයට උපකාරී වන අත්‍යවශ්‍ය අංගයක් වන අතර, එමගින් මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතතාව සහ මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව සම්ප්‍රේෂණය වීම තහවුරු කරයි. ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවතින විට ගෙවීම් හා පියවීම් සියල්ල නිසි පරිදි සිදු වන බැවින්, ගෙවීම් හා පියවීම් පද්ධතිය සුමටව ක්‍රියා කරයි. බැංකුවලට, කිසියම් ආයතනයක හෝ ආයතන කිහිපයක ද්‍රවශීලතා අවශ්‍යතාව සපුරාලීමට හැකියාව ඇතත්, සමස්ත පද්ධතියෙහිම ද්‍රවශීලතා අවශ්‍යතාව සැපයීමට හැකියාවක් නොමැත. එසේ වුවත්, මහ බැංකුවක සමස්ත පද්ධතියෙහිම ද්‍රවශීලතා අවශ්‍යතාව සපුරා ලීමට, ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාව ලබාදීමට හැකියාව ඇත. ඒ අනුව, මූල්‍ය ආයතනවලට ණය ලබාදීම සහ ඔවුන්ගේ අතිරික්ත අරමුදල් භාර ගැනීම හරහා සමස්ත ද්‍රවශීලතාව නියාමනය කරමින් මහ බැංකුව විශේෂ කාර්ය භාරයක් ඉටු කරයි. එහිදී, ද්‍රවශීලතාව පිළිබඳ ප්‍රවණතා සමීපව නිරීක්ෂණය කරමින් නිසි ලෙස ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමත්, ප්‍රමාදයකින් තොරව අවශ්‍යතාව අනුව ක්‍රියාමාර්ග ගැනීමත් හරහා ද්‍රවශීලතාව හිතකර මට්ටමක පවත්වා ගැනීමට මහ බැංකුවට හැකියාව ඇත. මෙලෙස හිතකර මට්ටමක ද්‍රවශීලතාව පවත්වා ගැනීම, පොලී අනුපාතික ස්ථාවරව පවත්වා ගැනීමටත්, ගෙවීම් හා පියවීම් පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීමටත් ඉතා වැදගත් වේ. ඒ අනුව, ද්‍රවශීලතා කළමනාකරණය පොලී අනුපාතික හා මුදල් වෙළඳපොළ ස්ථාවරත්වය සඳහා මෙන්ම ආර්ථිකයේ සමස්ත මූල්‍ය පද්ධති ස්ථායීතාව ඇති කිරීමෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.

# ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණ

වෙළඳපොළ පොලී අනුපාතික කෙරෙහි වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වය බලපෑම් කරන බැවින්, කෙටිකාලීන පොලී අනුපාතික අපේක්ෂිත මට්ටමේ පවත්වා ගනිමින් ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විවිධ මුදල් ප්‍රතිපත්ති උපකරණ භාවිත කරයි. මෙම ප්‍රතිපත්ති උපකරණ අතුරින්, ප්‍රතිපත්ති පොලී අනුපාතික, විවට වෙළඳපොළ කටයුතු සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව යනාදිය මහ බැංකුවෙහි ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණ ලෙස සැලකේ.

**6 වන රූප සටහන : ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති උපකරණ**

**ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණ**

- ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විවට වෙළඳපොළ කටයුතු
- ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව
- ප්‍රමාණාත්මක ණය පාලන ක්‍රම
- පොලී අනුපාතික මත සීමා
- ඵලදායී සන්නිවේදනය හා ඉදිරි මාර්ගෝපදේශන
- ශිෂ්ට ප්‍රයෝග

**අනෙකුත් ප්‍රතිපත්ති උපකරණ**

- සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ග
- විදේශ විනිමය මෙහෙයුම්
- ප්‍රතිමූල්‍ය පහසුකම්
- බැංකු අනුපාතිකය

## ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විවට වෙළඳපොළ කටයුතු

වර්තමානයේදී මහ බැංකුව ප්‍රධාන වශයෙන් වෙළඳපොළ මත පදනම්ව සක්‍රීය විවට වෙළඳපොළ කටයුතු (Active Open Market Operations) ඔස්සේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි. විවට වෙළඳපොළ කටයුතුවල ප්‍රධාන අරමුණ වන්නේ බැංකු පද්ධතියෙහි පවත්නා ද්‍රවශීලතා මට්ටම කළමනාකරණය කිරීම සහ මුදල් සැපයුමට (බැංකු පද්ධතියෙහි සංචිත), කෙටිකාලීන පොලී අනුපාතිකවලට මෙන්ම, අවසාන වශයෙන් දිගුකාලීන පොලී අනුපාතිකවලට සහ වත්කම් මිල ගණන් කෙරෙහි බලපෑම් ඇති කිරීමයි. තැන්පතු සහ ණය පොලී අනුපාතික වැනි අනෙකුත් පොලී අනුපාතික මත සිදු වන බලපෑම, ඉන්පසුව කුටුම්බ සහ ව්‍යාපාර විසින් ගනු ලබන ඉතුරුම් හා වියදම් තීරණ කෙරෙහි ද බලපානු ලබන අතර, අවසාන වශයෙන් රටේ ආර්ථික කටයුතු සහ සාමාන්‍ය මිල මට්ටම කෙරෙහි බලපෑම් ඇති කරනු ලබයි.

විවට වෙළඳපොළ කටයුතු රාමුවෙහි ප්‍රධාන අංගයක් වන්නේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකවලින් සමන්විත නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවයි (Standing Rate Corridor). මෙම ප්‍රතිපත්ති පොලී අනුපාතික ආර්ථිකයෙහි පදනම් පොලී අනුපාතික ලෙස ක්‍රියාකරන අතර, ඒමගින් අනෙකුත් සියලුම පොලී අනුපාතික තීරණය කෙරේ. ප්‍රතිපත්ති පොලී අනුපාතික තුළින් ආර්ථිකයෙහි පොලී අනුපාතික මට්ටම මෙන්ම දිශානතිය පිළිබඳව මාර්ගෝපදේශනයක් සලසන අතර, ඒ මත පදනම්ව ආර්ථිකයෙහි පවතින බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට ණය සහ තැන්පතු සඳහා අදාළ වන පොලී අනුපාතික නිදහසේ තීරණය කිරීමේ හැකියාව ලැබේ. ඒ අනුව, ප්‍රතිපත්ති පොලී අනුපාතික මූල්‍ය පද්ධතිය, බැංකු පද්ධතිය මෙන්ම සමස්ත ආර්ථිකය තුළම ප්‍රධාන කාර්යභාරයක් උසුළන අතර, ඉලක්කගත උද්ධමන මාවත ළඟාකර ගැනීමට යොදා ගන්නා ප්‍රධානතම උපකරණය ලෙස ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ආර්ථිකයෙහි පොලී අනුපාතිකවල ස්ථායීතාව තහවුරු කිරීමට මෙන්ම, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සංඥා කිරීම සඳහා යොදා ගනු ලබන යාන්ත්‍රණය ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකේ.

ප්‍රතිපත්ති පොලී අනුපාතික, මහ බැංකුවේ නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සඳහා පදනම් වන අතර, ඒවා මුදල් වෙළඳපොළෙහි එක්දින ගනුදෙනුවලට අදාළ පොලී අනුපාතිකයෙහි ඉහළ සහ පහළ සීමාව ලෙස ක්‍රියා කරයි. නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි පහළ සීමාව ලෙස සැලකෙන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (Standing Deposit Facility Rate) මෙන්ම, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව ලෙස සැලකෙන නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (Standing Lending Facility Rate) ආර්ථිකයෙහි කෙටිකාලීන පොලී අනුපාතික ස්ථායී ලෙස පවත්වා ගැනීමට සහාය වෙයි. සමස්ත පොලී අනුපාතික ව්‍යුහයෙහි ස්ථායීතාව තහවුරු කිරීම සඳහා මහ බැංකුවට සෘජුවම බලපෑම් කිරීමට හැකි වන්නා වූ, විශේෂයෙන්ම, කෙටිකාලීන පොලී අනුපාතිකවල ස්ථායීතාව පැවතීම ඉතාමත් වැදගත් වේ. මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස් කිරීම ප්‍රකාශයට පත්කිරීමත් සමග, එය අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ වෙත ඉතා ඉක්මණින් බලපෑමක් ඇති කරයි. කෙටිකාලයක් ඇතුළත අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතිකය වෙනස්වීම අනෙකුත් කෙටිකාලීන මුදල් වෙළඳපොළ පොලී අනුපාතික (භාණ්ඩාගාර බිල්පත් අනුපාතික වැනි) කෙරෙහි සම්ප්‍රේෂණය වෙයි. ඉන්පසුව, එහි බලපෑම මූල්‍ය ආයතනවල ණය සහ තැන්පතු සඳහා වන පොලී අනුපාතික ද ඇතුළුව සියලුම මැදිකාලීන සහ දිගුකාලීන පොලී අනුපාතික වෙත සම්ප්‍රේෂණය වේ. පොලී අනුපාතික ස්ථායීතාව තහවුරු කිරීම සඳහා සහ පොලී අනුපාතික සම්ප්‍රේෂණයෙහි මුල්ම පියවර වශයෙන් අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතිකය, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව තුළ පවත්වාගෙන යෑමට මහ බැංකුව උත්සාහ කරයි.

මෙම අවශ්‍යතාව ඉටුකර ගැනීම සඳහා මහ බැංකුව විවට වෙළඳපොළ කටයුතු සිදු කරයි. මුදල් ප්‍රතිපත්ති රාමුවේ මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව තුළ පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වන ද්‍රවශීලතාව මහ බැංකුව විසින් මුදාහැරීම හෝ අවශෝෂණය කිරීම විවට වෙළඳපොළ කටයුතු ලෙස හැඳින්වේ. එබැවින්, කෙටිකාලීන පොලී අනුපාතික මත බලපෑම් කිරීම තුළින් දිගුකාලීන පොලී අනුපාතික සහ සමස්ත ආර්ථික කටයුතු කෙරෙහි බලපෑම් ඇති කිරීම සඳහා දේශීය මුදල් වෙළඳපොළ තුළ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන වෙළඳපොළ පදනම් කරගත් ප්‍රධානතම මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් ක්‍රියාවලිය ලෙස විවට වෙළඳපොළ කටයුතු ලෙස හැඳින් වේ. මෙම විවට වෙළඳපොළ ගනුදෙනුවලදී රජයේ සුරැකුම්පත් ඇප සුරැකුම් ලෙස භාවිත කරයි.





මුදල් මණ්ඩලය විසින් ගනු ලබන මුදල් ප්‍රතිපත්තිමය තීරණ දෛනික මුදල් මෙහෙයුම් බවට පරිවර්තනය කිරීමේ වගකීම පැවරී ඇති වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණ මත පදනම්ව මහ බැංකුව විසින් විවට වෙළඳපොළ කටයුතු සිදු කරයි. ද්‍රවශීලතා පුරෝකථනය, මෙහෙයුම් ඉලක්කයෙහි අපේක්ෂිත මට්ටම, සහභාගිත්ව ආයතන අතර වෙළඳපොළ ද්‍රවශීලතා ව්‍යාප්තිය සහ යෝග්‍ය සංඥා ලබාදීමේ අවශ්‍යතාව වැනි විවිධ සාධක සැලකිල්ලට ගනිමින්, පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව වෙළඳපොළ මෙහෙයුම් කමිටුව දෛනික මෙහෙයුම් ක්‍රියාකාරකම් තීරණය කරයි..

උදාහරණයක් ලෙස, බැංකු පද්ධතියෙහි අතිරික්ත මුදල් ප්‍රමාණයක් (ද්‍රවශීලතා අතිරික්තයක්) පවතින බවට මහ බැංකුව විසින් ඇස්තමේන්තු කරන ලද විටෙක, පොලී අනුපාතික පහළ යෑමේ ප්‍රවණතාවක් පවතී නම්, එම තත්ත්වය මගහරවා ගැනීමට අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමට කටයුතු කෙරේ. එවැනි අවස්ථාවලදී මහ බැංකුව විසින් විකුණුම් හා ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ රජයේ සුරැකුම්පත් විකිණීම සිදු කරනු ලබන අතර, එය සාමාන්‍යයෙන් ප්‍රතිමිලදී ගැනුම්

(Repurchase) ගනුදෙනු ලෙස හැඳින්වේ. එමගින් ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම හරහා අතිරික්ත ද්‍රවශීලතාව අඩු කිරීමට ක්‍රියා කෙරේ. අනෙක් අතට, ද්‍රවශීලතා හිඟයක් පවතින අවස්ථාවකදී, මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් (Reverse Repurchase) වෙන්දේසි යොදා ගැනීම හරහා රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම මගින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අරමුදල් (ද්‍රවශීලතාව) සැපයීම සිදු කෙරේ. ප්‍රතිමිලදීගැනුම් හා ප්‍රතිවිකුණුම් ගනුදෙනු පරිණත වන අවස්ථාවේදී, අරමුදල් සහ සුරැකුම්පත් නැවත හුවමාරු වීමක් සිදු වේ (7 වන රූප සටහන බලන්න).


**7 වන රූප සටහන : මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු ක්‍රියාවලිය**




***සටහන :*** *මහ බැංකුවේ ප්‍රතිවිකුණුම් ක්‍රියාවලිය පහත පරිදි වේ. පළමු අදියර : මහ බැංකුව රජයේ සුරැකුම්පත් ගිවිසගත් කාලසීමාවකට සහභාගිත්ව ආයතනවලින් මිලදී ගනී (මහ බැංකුව ද්‍රවශීලතාව වෙළඳපොළ වෙත ලබා දෙයි). දෙවන අදියර: - පරිණත වන අවස්ථාවේදී සහභාගිත්ව ආයතන ණයට ලබාගත් අරමුදල් ඊට අදාළ පොලී ප්‍රමාණය සමග මහ බැංකුව වෙත ලබාදී අදාළ සුරැකුම්පත් මහ බැංකුවෙන් ලබා ගනී.*

තාවකාලික සහ/හෝ ස්ථිර පදනම මත දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව මත බලපෑම් කිරීමට විවට වෙළඳපොළ කටයුතු යටතේ මහ බැංකුව විසින් විවිධ වර්ගයේ වෙන්දේසි පවත්වනු ලැබේ.. වර්තමානයේදී, සියලුම විවට වෙළඳපොළ කටයුතු භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සුරැකුම් ලෙස භාවිත කරමින් සිදු කෙරේ. සාමාන්‍යයෙන් එක්දින, කෙටිකාලීන සහ දිගුකාලීන පදනම මත තාවකාලික පදනමින් ද්‍රවශීලතාව සැපයීමට හෝ අවශෝෂණය කිරීමට ප්‍රතිමිලදීගැනුම් හෝ ප්‍රතිවිකුණුම් ගනුදෙනු සිදු කෙරේ. කෙසේ වෙතත්, අඛණ්ඩව ද්‍රවශීලතා හිඟයක් හෝ අතිරික්තයක් පවතී නම්, වෙළඳපොළ ද්‍රවශීලතාව මත ස්ථිර ලෙස බලපෑම් කිරීම සඳහා මහ බැංකුව විසින් ස්ථිර පදනම මත වූ වෙන්දේසි හරහා රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම හෝ විකිණීම සිදු කෙරේ (8 වන රූප සටහන බලන්න).

8 වන රූප සටහන : විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම පිළිබඳ සාරාංශය



## නිත්‍ය පහසුකම

නිත්‍ය පහසුකම (Standing Facility), යනු විවට වෙළඳපොළ කටයුතු යටතේ ක්‍රියාත්මක වන මෙහෙයුම් උපකරණයකි. එය සුදුසුකම් ලත් වෙළඳපොළ පාර්ශ්වකරුවන්ට එක්දින පදනම මත සුරැකුම්පත් ඇපයට තබා ණය අරමුදල් ලබා ගැනීමටත්, අතිරික්ත අරමුදල් ඇත්නම් සුරැකුම්පත් රහිතව තැන්පත් කිරීමටත් පහසුකම් සපයන කවුළුවකි. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සහ අනෙකුත් සුදුසුකම් ලත් සහභාගිවන්නන් හට දෛනිකව සිය අමතර ද්‍රවශීලතා අවශ්‍යතා කළමනාකරණය කිරීම පිණිස මෙම පහසුකම උපකාරී වේ. නිත්‍ය ණය පහසුකම (Standing Lending Facility) හා නිත්‍ය තැන්පතු පහසුකම (Standing Deposit Facility) වශයෙන් දෙයාකාරයක නිත්‍ය පහසුකම් සෑම ව්‍යාපාරික දිනකදීම මහ බැංකුව සපයයි.

මුදල් වෙළඳපොළ වෙතින් හෝ මහ බැංකුව සිදු කරන විවට වෙළඳපොළ වෙන්දේසි හරහා තම කෙටිකාලීන අපේක්ෂිත හෝ අනපේක්ෂිත ද්‍රවශීලතා අවශ්‍යතා සම්පූර්ණ කරගත නොහැකි වූ සහභාගිත්ව ආයතනවලට, එම ද්‍රවශීලතා අවශ්‍යතා එක්දින පදනම මත ආවරණය කර ගැනීමට නිත්‍ය ණය පහසුකම මඟින් හැකියාව ලැබේ. එමෙන්ම, සිය අතිරික්ත ද්‍රවශීලතාව එක් දින පදනම මත මහ බැංකුවේ තැන්පත් කිරීම සඳහා සහභාගිත්ව ආයතනවලට නිත්‍ය තැන්පතු පහසුකම මඟින් අවස්ථාව සලසා ඇත. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, මුදල් වෙළඳපොළ එක්දින පොලී අනුපාතිකවල ඉහළ හා පහළ සීමා ලෙස ක්‍රියාත්මක වේ. නිත්‍ය පහසුකමෙහි ප්‍රධාන අරමුණ වන්නේ සහභාගිවන්නන්ගේ අතිරේක අරමුදල් අවශ්‍යතා සපුරාලීම සහ අතිරික්ත අරමුදල් තැන්පතුවලට සරිලන ආදායමක් ඉපයීමට අවස්ථාව ලබාදීම තුළින් මුදල් වෙළඳපොළ කෙටිකාලීන පොලී අනුපාතිකවල විචලනය අවම කිරීමයි. වර්තමානයේදී මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම ඇප සුරැකුම්පත් රහිතව (එනම්, මහ බැංකුව නිත්‍ය තැන්පතු සඳහා සුරැකුම්පත් ලබාදීමකින් තොරව) ක්‍රියාත්මක වන අතර, රජයේ සුරැකුම්පත් ඇපකරයක් ලෙස පිළිගැනීම මඟින් (එනම්, සහභාගිත්ව ආයතන විසින් අරමුදල් ලබාගැනීමට රජයේ සුරැකුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු) නිත්‍ය ණය පහසුකම සපයනු ලැබේ.

## ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව

ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව (Statutory Reserve Requirement) යනු ස්ථිර පදනමක් මත ද්‍රවශීලතාව මත බලපෑම් කිරීම සහ මුදල් ගුණකය හරහා ආර්ථිකයේ මුදල් මට්ටම කළමනාකරණය කිරීම සඳහා මහ බැංකුව විසින් භාවිත කරනු ලබන මුදල් ප්‍රතිපත්ති මෙවලමකි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය මුළු රුපියල් තැන්පතු වගකීම්වලට අනුපාතිකව මහ බැංකුවේ පවත්නා තම ගිණුමේ මුදල් තැන්පතුවක් ලෙස ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව පවත්වා ගත යුතු අතර, එය මුදල් නීති පනත යටතේ වන නෛතික අවශ්‍යතාවකි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය යටතේ පවත්වාගත යුතු සංචිත ගණනය කිරීම සඳහා වාණිජ බැංකු සතු රුපියල්වලින් නාමනය කරනු ලබන මුළු තැන්පතු වගකීම්, එනම් ඉල්ලුම් තැන්පතු, කාලීන හා ඉතුරුම් තැන්පතු සහ වෙනත් තැන්පතු සමස්තය සලකා බැලේ. ආර්ථිකයෙහි මුදල් සැපයුම සහ පොලී අනුපාතික කෙරෙහි බලපෑම් ඇති කරමින් වෙළඳපොළෙහි අඛණ්ඩව පවතින ද්‍රවශීලතා ගැටලු විසඳීම සඳහා මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ප්‍රධාන වශයෙන්ම භාවිත කරයි. සංචිත අනුපාතය වෙනස් කිරීම මඟින් බලපත්‍රලාභී වාණිජ බැංකු හට සිය ගනුදෙනුකරුවන්ට ණය ලබාදීම වෙනුවෙන් භාවිත කළ හැකි මුදල් ප්‍රමාණය මත මහ බැංකුවට බලපෑම් කළ හැකිය.

**1 වන සංඛ්‍යා සටහන : ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ගණනය කිරීම**

| අයිතමය | ප්‍රමාණය (රු. බිලියන) |
|---|---|
| 1. මුළු තැන්පතු වගකීම්වල සාමාන්‍යය (රුපියල්වලින් නාමනය කරන ලද) | 8,000 |
| 1.1 ඉල්ලුම් තැන්පතු | 400 |
| 1.2 කාලීන හා ඉතුරුම් තැන්පතු | 7,500 |
| 1.3 වෙනත් තැන්පතු | 100 |
| 2. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව (මුළු තැන්පතු වගකීම්වලින් සංචිත අවශ්‍යතා අනුපාතය සියයට 4 ක් ලෙස සලකා) | 320 |
| 3. බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා කාසි හා නෝට්ටු වශයෙන් ලබාදෙන සහනය (කැට මුදල් සහනය මුළු තැන්පතු වගකීම්වලින් සියයට 1 ක් ලෙස සලකා) | 80 |
| **4. සංචිත කාලපරිච්ඡේදය සඳහා මුළු සංචිත අවශ්‍යතාව** | **240** |

එමෙන්ම, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සපුරාලීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලට යම් ප්‍රතිශතයක් ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි ලෙස ද පවත්වා ගත හැකි අතර, එය "කැට මුදල් සහනය" (Till Cash Concession) ලෙස සැලකෙයි. බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා සංචිත අවශ්‍යතාව ගණනයේදී අදාළ කැට මුදල් සහනය ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයෙන් අඩු කොට දක්වනු ලැබේ. උදාහරණයක් ලෙස, බලපත්‍රලාභී වාණිජ බැංකුවල මුළු තැන්පතු වගකීම්වල සාමාන්‍යය රුපියල් බිලියන 8,000 ක් සහ, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සියයට 4 ක් හා කැට මුදල් සහනය මුළු තැන්පතු වගකීම්වලින් සියයට 1 ක්, එනම් රුපියල් බිලියන 80 ක් වේ නම්, සංචිත කාලපරිච්ඡේදය තුළ අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පවත්වා ගත යුතු සංචිත අවශ්‍යතාව වනුයේ රුපියල් බිලියන 240 කි (1 වන සංඛ්‍යා සටහන බලන්න).

මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ඉහළ නැංවීම මඟින් ණය සැපයීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලට භාවිත කළ හැකි මුදල් ප්‍රමාණයට බලපෑම් කොට ණය මැවීම පාලනය කළ හැකි අතර (මුදල් සැපයුම සංකෝචනය වේ), එමඟින් ආර්ථිකයේ පොලී අනුපාතික ඉහළ නැංවිය හැකිය. අනෙක් අතට, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහත හෙළීම මඟින් වාණිජ බැංකු සතු ද්‍රවශීලතාව ඉහළ යන අතර, වාණිජ බැංකුවලට ණය දීමේ හැකියාව පුළුල් වී (මුදල් සැපයුම ප්‍රසාරණය වී) එමඟින් ආර්ථිකයට මුදල් ගලා යෑමේ ප්‍රතිඵලයක් ලෙස පොලී අනුපාතික පහත වැටීමක් සිදු විය හැකිය. එමෙන්ම, දෛනිකව බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මුහුණ දීමට ඉඩ ඇති අනපේක්ෂිත ගෙවීම් හා පියවීම් අවශ්‍යතා ඉටු කිරීම සඳහා ද ආවරණයක් ලෙස ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව උපයෝගී කර ගැනේ. ඒ අනුව, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව යටතේ වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන ශේෂය ජංගම ගිණුමේ පියවීම් ශේෂය ලෙස ද හඳුන්වනු ලැබේ.

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වෙනස් වීම තුළින් ආර්ථිකය මත ඇති වන බලපෑම 9 වන රූප සටහන මඟින් නිරූපණය කෙරේ.

මෙම ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණවලට අමතරව, මහ බැංකුව, විවිධ අංශ හෝ කර්මාන්ත සඳහා සපයනු ලබන ණය සඳහා සීමා පැනවීම සහ ණය හෝ ගනුදෙනුකරුවන්ගේ තැන්පතු මත වන පොලී අනුපාතික සඳහා සීමා පැනවීම යනාදී මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ද භාවිත කරයි.

ආර්ථික නියෝජිතයන්ගේ තීරණ අනාගත ආර්ථික වර්ධනයන් පිළිබඳව වන අපේක්ෂා මත පදනම් වන බැවින් විනිවිදභාවයෙන් යුක්ත සහ විශ්වාසදායී සන්නිවේදනය ද මහ බැංකුව තවත් මුදල් ප්‍රතිපත්ති උපකරණයක් ලෙස භාවිත කරයි. ආර්ථිකයේ ඉහළ අවිනිශ්චිත තත්ත්වය පවතින අවස්ථාවලදී මහ බැංකුවේ ඵලදායී සන්නිවේදනය සහ ඉදිරි මාර්ගෝපදේශනය (Forward Guidance) ඉතා වැදගත් වේ.

සිය අරමුණු සපුරා ගැනීමේදී මග පෙන්වීමක් ලෙස සහභාගිත්ව ආයතනවල ක්‍රියාකාරකම් මහ බැංකුවේ අරමුණු සමග අනුගත වීම සඳහා මහ බැංකුව ශිෂ්ට ප්‍රයෝග (Moral Suasion) ද භාවිත කරයි. ඒ අනුව, මහ බැංකුවේ ප්‍රතිපත්ති දිශානතිය හා සමගාමීව වෙළඳපොළ හැසිරීම හා අපේක්ෂා අනුගත නොවන අවස්ථාවලදී සහභාගිත්ව ආයතන විසින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලින් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා යොමු කිරීම එමඟින් සිදු වේ.

## අනෙකුත් ප්‍රතිපත්ති උපකරණ

ආර්ථිකයේ පවත්නා අනෙකුත් අවශ්‍යතාද සැලකිල්ලට ගනිමින් සාර්ව විචක්ෂණ ක්‍රමෝපායයන්, විදේශ විනිමය මෙහෙයුම්, ප්‍රතිමූල්‍ය පහසුකම් සහ බැංකු අනුපාතිකය යනාදී ප්‍රතිපත්ති උපකරණද මහ බැංකුව උපයෝගී කර ගනී.


සාමාන්‍යයෙන් මූල්‍ය පද්ධතිය මුහුණ දෙන පද්ධති අවදානම අවම කිරීම සඳහා මහ බැංකුව සාර්ව විචක්ෂණශීලී උපකරණ (Macro Prudential Tools) භාවිත කරයි. උදාහරණයක් ලෙස විදේශීය අංශය මත ඇතිවන පීඩනය අවම කිරීම සඳහා ආනයන අධෛර්ය කිරීමේ අරමුණ ඇතිව ආනයන මත මුදල් ආන්තික අවශ්‍යතා හඳුන්වා දීම, ආර්ථික චක්‍රයෙහි බලපෑමෙන් ආරක්ෂා වීම සඳහා වන ප්‍රාග්ධන ස්වාරක්ෂකය, ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය, උත්තෝලන අනුපාත මත සීමා, ණය සේවාකරණ - ආදායම් අනුපාත සීමා වැනි ක්‍රියාමාර්ග ද හඳුන්වා දීම මූල්‍ය පද්ධතියෙහි මෙන්ම, ආර්ථිකයෙහි අස්ථාවර බව අවම කිරීමට යොදා ගත හැකිය.

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී මහ බැංකුව විදේශ විනිමය මෙහෙයුම් කටයුතු ද උපයෝගී කර ගනී. උදාහරණයක් ලෙස, මහ බැංකුව, ඉදිරි දිනයකදී විදේශ විනිමය නැවත විකිණීමේ/මිලදී ගැනීමේ පදනම මත විදේශ විනිමය මිලට ගැනීම හෝ විකිණීම සඳහා විදේශ විනිමය හුවමාරු ගනුදෙනු (Foreign Exchange Swap Transactions) සිදු කිරීම එවැනි විදේශ විනිමය මෙහෙයුම් අතර ප්‍රමුඛත්වය ගනු ලබන අතර, මෙවැනි මෙහෙයුම් තුළින් දේශීය මූල්‍ය වෙළෙඳපොළ ද්‍රවශීලතාව මත බලපෑමක් ඇති කෙරේ.

මෙයට අමතරව, අසාමාන්‍ය තත්ත්වවලදී ආර්ථිකයට සහ මූල්‍ය අංශයට සහාය දැක්වීම සඳහා තෝරාගත් අංශවලට මූල්‍ය ආයතන හරහා සහනදායී පොලී අනුපාතික යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීමට හෝ මූල්‍ය ආයතන සඳහා විශේෂ පහසුකම් ලබාදීමට මහ බැංකුවට හැකියාව තිබේ.

බැංකු සඳහා මහ බැංකුවෙන් මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් යටතේ පමණක් නොව, පද්ධතිමය ද්‍රවශීලතා ගැටලු මග හරවා ගැනීම සඳහා ද්‍රවශීලතා උපකාරක පහසුකම් මෙන්ම විශේෂ තත්ත්ව වලදී ලබාදෙනු ලබන හදිසි මූල්‍ය අවශ්‍යතා යටතේ ද අරමුදල් ලබාගැනීමේ හැකියාව පවතී. මහ බැංකුව විසින් වර්තමාන නෛතික ප්‍රතිපාදන යටතේ, බැංකු ආයතන සඳහා වන මෙම ද්‍රවශීලතා ආධාරක පහසුකම් බැංකු අනුපාතිකය (Bank Rate) මත පදනම්ව සපයනු ලබයි. සාමාන්‍යයෙන්, බැංකු අනුපාතිකය අනෙකුත් පොලී අනුපාතිකවලට සාපේක්ෂව ඉහළ පොලී අනුපාතිකයක් වේ.

### 9 වන රූප සටහන : ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා තුළින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම




* කැට මුදල් සහනය ශූන්‍ය ලෙස සලකා ඇත


# III කොටස : මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලිය

මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ආර්ථිකයෙහි කටයුතු මත බලපෑම් කරමින් මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන ආර්ථික සහ මිල ස්ථායිතාව ඇති කර ගැනීමට ඉවහල් වන ආකාරය මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලිය (Monetary Transmission Mechanism) මගින් පැහැදිලි වේ. මෙම ක්‍රියාවලිය සාමාන්‍යයෙන් අදියර දෙකකින් සමන්විත වන අතර, ආර්ථික කටයුතුවලට සිදුවන බලපෑම කිනම් අවස්ථාවේදී, කොපමණ ප්‍රමාණයකින් සිදු වේද යන්න නිශ්චිතව දැක්වීම බොහෝ සෙයින් අසීරුය. විශේෂයෙන්, දිගුකාලීන පොලී අනුපාතික සම්බන්ධයෙන් සලකන විට සම්ප්‍රේෂණයෙහි නියමාකාර සම්බන්ධතාව සහ සම්ප්‍රේෂණ කාලය අපැහැදිලි අතර, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී සම්ප්‍රේෂණය හුදෙක් අපැහැදිලි ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගත හැකිය.

පළමු අදියරේදී, ප්‍රතිපත්ති පොලී අනුපාතික ආර්ථිකයෙහි අනෙකුත් පොලී අනුපාතික වෙත බලපෑම් කිරීම (කෙටිකාලීන හා දිගුකාලීන) සිදු වන්නේ කෙසේද යන්න සහ දෙවන අදියරේදී ආර්ථික ක්‍රියාකාරකම් සහ උද්ධමනය කෙරෙහි පොලී අනුපාතික බලපෑම් කරන්නේ කෙසේද යන්න පිළිබඳව පැහැදිලි කෙරේ.

අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අනුපාතිකය, එනම් බැංකු අතර ක්‍රියාත්මක එක්දින ණය පොලී අනුපාතිකය, එළදා වක්‍රය මඟින් නිරූපණය වන ආර්ථිකයෙහි අනෙකුත් පොලී අනුපාතික තීරණය කිරීමේ ප්‍රධාන සාධකයක් වන අතර, එය පොලී අනුපාතික සම්ප්‍රේෂණයෙහි පළමු අවදිය ලෙස හැඳින්විය හැකිය. සාමාන්‍යයෙන්, ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අනුපාතිකය මත ඉතා කඩිනමින් බලපෑම් ඇති කරනු ලබයි. එබැවින්, ප්‍රතිපත්ති පොලී අනුපාතික සංශෝධනය කිරීම සම්බන්ධව මහ බැංකුව විසින් සිදු කරනු ලබන නිවේදන, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතිකය මත ක්ෂණිකවම බලපෑම් ඇති කරයි. මෙලෙස ඒක්ෂණ වෙළඳපොළ පොලී අනුපාතිකයෙහි සිදුවන වෙනස්වීම්, පසුව වාණිජ බැංකුවල කෙටිකාලීන හා දිගුකාලීන ඉතුරුම් සහ ණය පොලී අනුපාතික වෙත ගලා යමින් එම පොලී අනුපාතික ද වෙනස් කරනු ලබයි. එහෙත්, වෙළඳපොළ තරගකාරීත්වය, විවිධ වෙළඳපොළ සහ ණය හා තැන්පතු වර්ගවල පවතින පරිණත කාලය හා අවදානම වැනි වෙනත් සාධක නිසා කෙටිකාලීන හා දිගුකාලීන පොලී අනුපාතික වෙනස්වීමට ගතවන කාලය සහ වෙනස්වීමේ ප්‍රමාණය මත බලපෑම් ඇති විය හැකිය.


මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලියේ දෙවැනි අදියරේදී මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික සම්බන්ධ තීරණ ආර්ථිකයෙහි පාර්ශ්වකරුවන්ගේ ආයෝජන සහ වියදම් පිළිබඳ තීරණ මත බලපෑම් ඇති කරන අතර, එමඟින් රටේ සමස්ත ඉල්ලුමටත්, ඉන්පසුව උද්ධමනයටත් බලපෑම් ඇති කරනු ලබයි. කෙසේ වෙතත්, මහ බැංකුව ප්‍රතිපත්ති තීරණ ගනු ලබන අවස්ථාවේ සිට එමඟින් අපේක්ෂා කරන වෙනස්කම් ආර්ථිකය තුළ සිදු වීමට සැලකිය යුතු කාලපමාවක් ගත වන අතර, කුටුම්බ හා ආයතන සිය හැසිරීම් වෙනස් කිරීම සඳහා යම් කාල සීමාවක් ගත කිරීම එයට හේතු වේ. මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණයෙහි දෙවන අදියර 10 වන රූප සටහන මඟින් සරලව පෙන්වා දී ඇත.



මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කළ විට (මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම) බැංකු පද්ධතියෙහි පොලී අනුපාතික ද අඩු වීම හේතුවෙන් ඉතිරි කිරීම් අඩු වී පුද්ගල පරිභෝජනය ඉහළ යයි. ඒ අනුව, අඩු පොලී අනුපාතික තුළින් වියදම් සඳහා උත්තේජනයක් සැපයෙන අතර, එය ආර්ථිකයෙහි සමස්ත ඉල්ලුම ඉහළ නැංවීමට හේතු වේ. කෙසේ වෙතත්, ඉහළ යන ඉල්ලුමට සරිලන පරිදි සැපයුම ඉහළ නැංවීමට නිෂ්පාදකයන් හට සාපේක්ෂව වැඩි කාලසීමාවක් ගත වන නිසා භාණ්ඩ මිල ඉහළ යෑමත් එහි ප්‍රතිඵලයක් ලෙස උද්ධමනය ඉහළ යෑමත් සිදු වේ. මෙලෙස සැපයුම වැඩි කිරීමට නිෂ්පාදකයන් හට වැඩි කාලසීමාවක් ගතවන්නේ ඒ සඳහා අමතර වශයෙන් අවශ්‍ය වන ශ්‍රමය හා යන්ත්‍රසූත්‍ර සපයා ගැනීම එක්වරම සිදු කළ නොහැකි වීමෙනි.

අනෙක් අතට, මහ බැංකුව පොලී අනුපාතික ඉහළ නැංවූ විට (මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම) බැංකුවල ණය පොලී අනුපාතික ද ඉහළ යයි. එවිට ණය අරමුදල්වල පිරිවැය ඉහළ යෑම හේතුවෙන් ණය ඉල්ලුමෙහි අඩු වීමක් සිදු වේ. ඒ අනුව, ඉහළ පොලී අනුපාතික රටේ සමස්ත ඉල්ලුම අඩු කිරීමටත්, ආර්ථික කටයුතු මන්දගාමී වීමටත් බලපාන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස උද්ධමන වේගය පහළ යෑමක් සිදු වේ. කෙසේ වුවත්, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණයෙහි දෙවන අදියර එහි පළමු අදියරට වඩා සංකීර්ණ වේ. 10 වන රූප සටහන මගින් පෙන්වා දී ඇති පරිදි, ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම් සහ මුදල් ප්‍රතිපත්ති උපකරණවල බලපෑම සාමාන්‍යයෙන් වෙළඳපොළ පොලී අනුපාතික, ණය ප්‍රමාණය, වත්කම් මිල, විනිමය අනුපාතිකය, අපේක්ෂණ වැනි විවිධ වූත් එකිනෙකට අන්තර සම්බන්ධ වූත් මාධ්‍ය ඔස්සේ ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වේ. විනිමය අනුපාතික, ශුද්ධ අපනයන මත බලපෑම් කරනු ලබන අතර, අනෙකුත් සාධක ප්‍රධාන වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙහි අනෙකුත් සංරචක වන පරිභෝජන සහ ආයෝජන වෙත බලපෑම් ඇති කරනු ලබයි.

**10 වන රූප සටහන : මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලිය**




උද්ධමන අපේක්ෂා, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලිය මත ද බලපෑම් ඇති කරයි. එමෙන්ම, ඉදිරි උද්ධමනය පිළිබඳ ආර්ථික පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා ඔවුන්ගේ වර්තමාන හැසිරීමට ද බලපෑම් කරනු ලැබේ. උදාහරණයක් ලෙස, ආර්ථිකයේ සේවා නියුක්තිකයන් උද්ධමනය ඉදිරියේ ඉහළ යෑමට ඉඩ ඇතැයි අපේක්ෂා කරන්නේ නම්, ඒ හා සමගාමීව ඔවුන් තමන්ගේ වැටුප් ද ඉහළ නැංවීමට ඉල්ලීම් කරනු ඇත. ඉහළ වැටුප් වර්ධක මිල ගණන් ඉහළ නැංවීමට හේතු වේ. එමනිසා, උද්ධමන ඉලක්ක ප්‍රකාශයට පත්කිරීම සහ ඵලදායී සන්නිවේදනය හරහා උද්ධමන අපේක්ෂා එම ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීමට මහ බැංකුවක් උත්සාහ කරයි. මෙමගින් උද්ධමනය පිළිබඳ අවිනිශ්චිතභාවය අඩු වන බැවින් කුටුම්බ සහ ව්‍යාපාරවලට සිය ඉතිරි කිරීම් හා ආයෝජන සම්බන්ධ තීරණ වැඩි විශ්වාසයෙන් යුක්තව ගැනීමට හැකියාව ලැබේ. ඒ අතරම, මුදල් ප්‍රතිපත්තියෙහි සඵලදායිත්වය සහ සාර්ථකත්වය මහ බැංකුවේ ස්වාධීනත්වය සහ විශ්වසනීයත්වය මත ද රඳා පවතී.■